ස්ථානය - යටියන්තොට ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව දිනය - 2022.07.19 වේලාව - පෙ.ව.9.00

**සහභාගි වූ ගරු මහජන නියෝජිතයින්**

1.ගරු සභාපති - කේ.ඩී.වසන්ත මැතිතුමා 2.ගරු උප සභාපති - ඒ.වී.රොහාන්ත ගුණසේකර මැතිතුමා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී**

3.- ඒ.එම්.සත්‍යානන්දන් මැතිතුමා 4.- කේ.ජී.සුමනතිස්ස ජයතිලක මැතිතුමා
5 - ජී.ම්.නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා 6.- ආර්.එම්.එස්.ඩබ්ලිව්.රාජපක්ෂ බණ්ඩාර මැතිතුමා
7- ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා 8- ඩබ්ලිව් .කතිකා දමයන්ති මැතිනිය
9.- කේ.කේ.නිමල් විජේසූරිය මැතිතුමා 10.- එන්.කේ.නිමල් කුමාරසිරි මැතිතුමා
11.- ඒ.ජී.තිලකරත්න මැතිතුමා 12.- ඩී.ඒ.එල්.සුනිල් දෙයියාගල මැතිතුමා
13.- පී.ඩබ්.අමිල හේමන්ත මැතිතුමා 14. - එම්.ඩබ්.හිමන්ත අජිත් බණ්ඩාර මැතිතුමා
15- එච්.ශාන්ත කුමාර හෙට්ටිකන්ද මැතිතුමා 16.- ඩී.පී ප්‍රේමසිරි ජයලත් මැතිතුමා
17- ජී.ආර්.ලාල් නිශාන්ත මැතිතුමා 18.- ඩබ්.ජී.සරත් ප්‍රේමසිරි මැතිතුමා
19 - එස්.සුදර්ශන් මැතිතුමා 20.- එච්.ඒ.දිල්සානි ප්‍රසාදිකා මැතිනිය
21.- කේ.මධුෂිකා ප්‍රශාදිනි ජයසිංහ මැතිනිය 22.- එම්.ඩී.පී.ඥානවති මැතිනිය
23- ටී.ඉමල්කා සංජීවනි මැතිනිය 24.- බී.ජී.සීතා රංජනි මැතිනිය
25. ඒ.පී.ඩබ්ලිව්.එම්.පී.ඩයනා උදයංගනි මැතිනිය 26.- එච්.ඒ.ප්‍රියන්ත පුෂ්ප කුමාර මැතිතුමා

**සහභාගි වූ නිලධාරින්**

1.ලේකම් - දුමින්ද සී.වික්‍රමසිංහ මහතා 2.සංවර්ධන නිලධාරි - ආර්.එච්.සී.නිසාන්ති සෙනවිරත්න මිය

**ගරු මහ සභාවට නොපැමිණි මන්ත්‍රීවරුන්ගේ නාම ලේඛනය**

01.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.පී.ජී.ඩබ්.කීර්තිසේන අල්විස් මැතිතුමා
02.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.කමල්රාජ් මැතිතුමා

ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැමිණි සිටි සියළුදෙනා ආගම සිහිකිරිමෙන් අනතුරුව ජාතික ගීය හා පළාත් ගීය ගායනයෙන් හා මියගිය රණවිරුවන් හට හා සහිකයින් ලෙස කටයුතු කර මිය ගිය මන්ත්‍රීතුමන්ලා හට ,කාර්යය මණ්ඩලයට ගෞරව කිරිමෙන් පසු සභාවේ කටයුතු පෙරවරු 9.00 ආරම්භ කරන ලදී.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

අද දින පැවැත්වෙන මහ සභා රැස්වීම සඳහා සහභාගි වි සිටින ගරු මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලා ,කාර්යය මණ්ඩලය ගෞරවයෙන් සෙනෙහසින් යුතුව පිළිගනු ලබනවා.රටේ පවතින තත්වයත් සමඟ සියළුම දෙනාට ආරාධනා කරනවා බල ප්‍රදේශයේ ජනතාවගේ ගැටළු අවශ්‍යතාවයන් පමණක් කථා කරලා ගැටළු විසදා ගැනීමට . සභාවේ ඉදිරි කටයුතු කරගෙන යාම සඳහා ඔබතුමන්ලාගේ සහයෝගය අපේක්ෂා කරනවා.

**(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරිම**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** 2022.06.21 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව මා විසින් ඔබ වෙත එවා ඇති අතර ඔබ සියළු දෙනා විසින් එය කියවූවා සේ සලකා එහි කිසියම් නිවැරදි කිරීම් හෝ සංශෝධන නොමැති නම් වාර්තා කර ඇති පරිදි ස්ථිර කරන ලෙසට හා නිවැරදි කිරීම් හෝ සංශෝධන ඇත්නම් එය සංශෝධනය කරන ලෙසත් සභාවට මා දන්වා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.සත්‍යානන්දන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ගරු මහ සභාවට ඉදිරිපත් කරන ලද 2022.06.21 වන දින පැවැති මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධන රහිතව සභා සම්මත කිරිම සුදුසු බව මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා** ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** 2022.06.21 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධන රහිතව සභා සම්මත වූ බව ගරු මහ සභාවට නිවේදනය කර සිටිනවා.

**(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන -**

*. යටියන්තොට ප්‍රාදේශීය සභාව සතු අංක 047-1001-00000001 දරන ජංගම ගිණුමේ 2022.07.01 දිනට ශේෂය ප්‍රා.ස.10 මුදල් පොත අනුව රු.180,000.0ක් පමණ විය.මේ දිනවල ආදායම් ලැබීම්ද සමාන්‍ය පරිදි සිදු නොවන බැවින් හා පවතින මුදල් ශේෂය අනියම් වැටුප් ගෙවීම ඇතුළු ඉදිරි දෛනික සහ අපේක්ෂිත වියදම් දැරීමට ප්‍රමාණවත් නොවන බැවින් සභාව සතු ආයෝජන ලෙස පවත්වාගෙන යනු ලබන 2022.08.04 දිනට කල්පිරීමට නියමිත ලංකා බැංකු ස්ථාවර තැන්පත් ගිණුම් අංක 88061778 දරන රු.1,500,000.00 වටිනා ස්ථාවර තැන්පතුව 2022.07.05 දින නිදහස් කර මහජන බැංකු ජංගම ගිණුමට බැර කරන ලද බව ගරු මහා සභාවට නිවේදනය කරමි.

*.සබරගමුව පළාත් පාලන කොමසාරිස්ගේ අංක CLG/LG/K/02/03/11 දරන 200.06.15 වන දිනැති ලිපිය මගින් නීතිඥ එච්.ආර්.අනුර ජයසිරි මහතා විසින් එවන ලද ලිපියේ පිටපතක් මා වෙත ලැබී ඇත.එකී ලිපියෙන් කැළණිවැලි ප්ලාන්ටේෂන් පී.එල්.සී.සමාගමට අයත් හල්ගොල්ල වතුයාය සතු මාර්ගයට ආරම්භක පිවිසුමේ සවිකර ඇති ගේට්ටුව ගලවා ඉවත් කිරීමේ බලයක් සභාව සතු නොවන බවත්,එසේ කටයුතු කිරීමට සභාව කටයුතු කළහොත් සභාවට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට සිදුවන බවත් සඳහන් කර ඇති බව නිවේදනය කරමි.

*.යටියන්තොට ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයට අදාල අයවැය ලේඛනය සකස් කිරීමේ මූලික කටයුතු ආරම්භ කර ඇත.ඒ සඳහා ඔබ කොට්ඨාශය නියෝජනය වන පරිදි අයවැය ලේඛනයට ඇතුලත් කිරීම සඳහා වූ යෝජනා 2022.08.15 ට පෙර යටියන්තොට ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ලබා දීමට කටයුතු කරන මෙන් නිවේදනය කරමි.

**(ඇ)ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම්,පැමිණිලි ඉදිරිපත් කිරීම**
**(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න -** නැත
**(ඉ) කල් දී ඇති යෝජනා**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 01. යටියන්තොට ප්‍රාදේශීය සභාවට අයත් පුස්තකාල ත්‍රිත්වය සඳහා පහත සඳහන් කතෘ ප්‍රකාශන මිලදී ගැනීමට අදාලව පුස්තකාල ත්‍රිත්වයෙහි පුස්තකාල සහායිකාවන් විසින් ඉල්ලීම් කර ඇත.එම කතෘ ප්‍රකාශන පිටපත් 03 බැගින් මිලදී ගැනීමටත් ඒ සඳහා ගෙවීම් කිරීමටත් ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

| පොතේ නම | මිල | පොතේ නම | මිල |
|---|---|---|---|
| 1 ආචාරශීලි ශ්‍රී ලංකාවක් | රු.1200. | 6 අස්ගී | රු.550.00 |
| 2 කොරෝනාවෙන් පසු තිරසර සංවර්ධන සහ සරල දැහැමි ජීවන රටාව | රු.1000.00 | 7 කවුරුන්ද මා ඔබේ | රු.1420.00 |
| 3 තීර්ගේ සාවි | රු.990.00 | 8 බෞද්ධ රාජ්‍ය පරිපාලන මූලධර්ම සහ භාවිතය | රු.1000.00 |
| 4 ඇදිරි කැකුළු | රු.790.00 | 9 ශ්‍රී ලංකාව සඳහා භාවිත නාමයන්ගේ ඉතිහාසය | රු.600.00 |
| 5 නුඹෙන් මිදී | රු.990.00 | 10 ශුක්ල මුහුර්තය(නවකතා) | රු.700.00 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිරි මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 01)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 02. පුස්තකාල සේවාවලට අදාල ගාස්තු පහත පරිදි සංශෝධනය කිරීමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

| | දැනට පවතින මිල | සංශෝධන මිල |
|---|---|---|
| සාමාජික ගාස්තු | රු 50.00 | රු..200.00 |
| පොත් ප්‍රමාද ගාස්තු | ශත 50 (දිනකට) | රු.2.00 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, 2023 වර්ෂය වන තෙක් දැනට පවතින මිලටම ලබා දීමටම මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ ප්‍රියන්ත පුෂ්පකුමාර මැතිතුමා**
ගරු සභාපතිතුමනි, රටේ පවතින තත්වයත් සමඟ දරුවන්ට මේ සේවාව පවතින මිලටම ලබා දෙමු කියා මා ප්‍රකාශ කර සිටිනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාවට අනුව පුස්තකාල සේවාවට අදාල ගාස්තු දැනට පවතින මිලම අයකර 2023 වර්ෂය සඳහා සංශෝධන මිල අය කිරීම සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් ඉහත යෝජනාවට අනුව පුස්තකාල සේවාවට අදාල ගාස්තු දැනට පවතින මිලම අයකර 2023 වර්ෂය සඳහා සංශෝධන මිල අය කිරීම ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 02)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

(ඉ) 03. සැලසුම් කමිටු දීමනාව වැඩිකර ගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂක ජනරාල්තුමා විසින් යොමු කරන ලද අංක DDG/p2/PC/LA සහ 2022.05.26 දිනැති ලිපිය මගින් ප්‍රාදේශීය සභාවේ සැලසුම් කමිටු සඳහා සහභාගි වන කමිටු සාමාජිකයන්ට ගෙවනු ලබන දීමනාව වැඩිකිරීමට ( රු.1500 – 2500) නිර්දේශ ලබා දී ඇත.ඒඅනුව මෙම සභාවේ සැලසුම් කමිටු සාමාජිකයින්ගේ සහභාගිත්ව දීමනාව තීරණය කිරීම සඳහා ගරු මහ සභාවේ අනුමැතියට ගරු සභාපතිතුමාගේ යෝජනාව

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම් නන්දසේන මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාවට අනුව පිටස්තර ආයතන නිලධාරින් සඳහා රු.2500.00ක් ද අනෙක් සාමාජිකයින් සඳහා රු.2000.00 ක් ද ලබා දීම සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා. ඉහත යෝජනාවට අනුව පිටස්තර ආයතන නිලධාරින් සඳහා රු.2500.00ක් ද අනෙක් සාමාජිකයින් සඳහා රු.2000.00 ක් ද ලබා දීම ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 03)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 04. 2022 වර්ෂයේ ප්‍රාදේශීය සභා අරමුදලින් ඉටු කරන ලද පහත සඳහන් කර්මාන්තවල බිල්පත් වටිනාකම ගෙවීම් කිරීමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.
01. කොස්කඳහේන නිහාල් ජිනදාස මයාගේ නිවස අසල මාර්ගය සංවර්ධනය කිරීම - රු. 268,029.32

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 04)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ගරු මන්ත්‍රී ජයතිලක මැතිතුමා ඔබගේ යෝජනාව ගරු සභාවට ඉදිරිපත් කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.එස්.ජයතිලක මැතිතුමා (ඉ) 05.** 2022.07.09 වන දින විරෝධතාව අතරතුර එක්සත් ජාතික පක්ෂ නායක ගරු අගමැති රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ නිවසට ගිනි තැබීම පිළිබඳව අප සභාවේ විරෝධය පල කිරීමට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.මෙම ගිනි තැබීම අපි තරයේ හෙළා දකිනවා.රාජකීය විද්‍යාලයට ලියලා තිබුණු නිවසක් මේක.මෙම ස්ථානයේ පුස්තකාලයක් තියෙනවා ඉතාමත් වටිනා පොත් තිබුණා නමුත් දැන් ඒවත් විනාශ වෙලා ගිහින්.මේ සම්බන්ධයෙන් ඉතාමත් කනගාටු වෙනවා.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ඒ.ප්‍රියන්ත පුෂ්පකුමාර මැතිතුමා** ගරු සභාපතිතුමනි,අවංකවම මේ ගිනි තැබීම පිළිබඳ මා කනගාටු වෙනවා.මෙවැනි වැරදි මින් ඉදිරියටත් නොවිය යුතුයි.මේ පිළිබඳව පරීක්ෂණයක් සිදු කළ යුතුයි මා ප්‍රකාශ කර සිටිනවා.
**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පි ප්‍රේමසිරි ජයලත් මැතිතුමා** ගරු සභාපතිතුමනි, අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ නිවසට ගිනි තැබීම පිළිබඳ ශෝකය ප්‍රකාශ කර සිටිනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාවට අනුව ගිනි තැබීම හෙළා දැකීම සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 05)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 06. 2022 ජූනි මස ගෙවීම් වාර්තාව ( රු.6,852,487.46) ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 06)**

## හදිසි යෝජනා

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 07. යටියන්තොට ප්‍රාදේශීය සභාවට අයත් SGRD 8015 දරන ට්‍රැක්ටරය අලුත්වැඩියා කිරිම වෙනුවෙන් දායක මෝටර්ස් ආයතනයට රු.26,800.00 ක මුදලක් ගෙවීම් කිරිමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 07)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** **(ඉ) 08.** යටියන්තොට ප්‍රාදේශීය සභාවට අයත් SGPF 7470 දරන කැබ් රථයේ ආසන කුෂන් කිරිම වෙනුවෙන් නිලන්ත කුෂන් වර්කස් ආයතනයට රු.75,000.00 ක මුදලක් ගෙවීම් කිරිම සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 08)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** **(ඉ) 09 .** අප සභාවේ සේවය කරන පහත සේවක මහත්ම මහත්මීන් ආපද ණය මුදලක් ඉල්ලීම් කර ඇත. ඒ සඳහා අනුමැතිය ලබා ගැනිමට මා යෝජනා කරනවා.

01.ඩබ්.එම්.ඒ.එස්.අබේකෝන් මිය - රු.70000.00
02.පී.වී.චමින්ද කුමාර මයා - රු.63500.00

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිරි මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 09)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ගරු සංජීව මන්ත්‍රීතුමා ඔබගේ යෝජනාව ගරු සභාවට ඉදිරිපත් කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා (ඉ) 10.** රටේ පවතින ඉන්ධන අර්බුදය හා ඇඳිරිනීති තත්වය යටතේ සභාව පැවැත්වෙන් දිනය විටින් විට කල් දැමීමට සිදු වේ.එම නිසා දෙවන සතියේ අඟහරුවාදා දින සභාව පැවැත්වීමට බාධාවන් පැවතිය හැකි බැවින් එදිනට ආසන්න දිනයක දි සභාව පැවැත්වීම සඳහා ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.එස්.ජයතිලක මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.හතරවෙනි සතියේ ලබා දෙන්න පුළුවන්නම් හොඳයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.එස් ඩබ්.රාජපක්ෂ බණ්ඩාර මැතිතුමා** ගරු සභාපතිතුමනි, සභාව හතරවන සතියේ අඟහරුවාදා දින පවත්වමු.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 10)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා (ඉ) 11.**යටියන්තොට ප්‍රාදේශීය සභාව සතු අමනාවල මහජන පුස්තකාලයෙන් මලල්පොල ග්‍රාම නිලධාරී වසමේ යොවුන්සර යෞවන සමාජ පුස්තකාලයට මාසිකව පොත් 200 ක් පමණ හුවමාරු ක්‍රමයට ලබාදෙන ලෙස ඉල්ලීම් කර ඇත.ඒ අනුව මාසිකව පොත් 200 පමණ හුවමාරු ක්‍රමයට ලබා දීමටත්,එම ක්‍රියාවලිය පවත්වාගෙන යාම වෙනුවෙන් සකසන ලද ගිවිසුම ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ටී.ඉමල්කා සංජීවනි මැතිනිය** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ගිවිසුම් ගතව ඒ අනුව කටයුතු කිරිම ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 11)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා (ඉ) 12.**පහත නම් සඳහන් සේවක මහත්මින්ගේ සේවා ගිවිසුම් කාළය දීර්ඝ කර ගැනිම සඳහා ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

01. වැඩ ක්ෂේත්‍ර කම්කරු ඒ.පී.ටී.එම්.පතිරණ මහතා 2022.07.31 සිට 2023.07.31

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ටී.ඉමල්කා සංජීවනි මැතිනිය** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාවට අනුව ඒ.පී.ටී.එම් පතිරණ මහතාගේ සේවා ගිවිසුම් කාලය තවත් වසරකින් දීර්ඝ කිරිම සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් ඒ.පී.ටී.එම් පතිරණ මහතාගේ සේවා ගිවිසුම් කාලය තවත් වසරකින් දීර්ඝ කිරිම ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 12)**

**(ඊ) කාරක සභා වාර්තා සළකා බැලීම**

**(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතු කළ ආදායම් පිළිබඳ මාසික වාර්තා**

01. 2022 මැයි මාසයට අදාල ආදායම් වියදම් වාර්තාව
02. 2022 මැයි මාසයට අදාල ආදායම් ප්‍රගති වාර්තාව
03. 2022 මැයි මාසයට අදාල අපේක්ෂිත සත්‍ය අදායම් හා වියදම් වාර්තාව

**(ඌ) වෙනත් කරුණු**
*** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිරි මැතිතුමා** ගරු සභාපතිතුමනි, පොදු ප්‍රවාහනය මගින් ගමන් ගන්නා ජනතාවට දැඩි දුෂ්කරතාවයට පත්වන බැවින් හා මෙම වසරේ හතර වතාවක් බස් ගාස්තු වැඩි වීම සිදු විය. එබැවින් මගී ජනතාවට සහන මිලකට ගමන් කිරිමටත්,ඒ සඳහා අවශ්‍ය බස් රථ ධාවනයට යෙදවිමටත්,කටයුතු කරන ලෙස ඉල්ලා අමාත්‍යතුමා වෙත ලිපියක් යොමු කරන මෙන් ඉල්ලා සිටිමි.

***ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ටී.ඉමල්කා සංජීවනි මැතිනිය** ගරු සභාපතිතුමනි, ඉන්දියානු රජය විසින් ලංකාවට ලබා දුන් සහල් සහනාධාරය මල්වත්ත වසම තුළ නිසි පරිදි බෙදා නොමැත.සුදුස්සාට සුදුසු පරිදි බෙදා දීමට ලබා දුන් මෙම සහනාධාර ක්‍රියාවලිය රාජ්‍යය සේවකයින් හට ද බෙදා දී ඇත.එහි දී, අසාධාරණයට ලක් වූ පිරිසට සාධාරණය ඉටු කර දීමට ප්‍රාදේශීය ලේකම් හට මේ පිළිබඳව දැනුවත් කර සුදුසු කෙනාට මෙය ලබා දීමට කටයුතු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

***ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එච්.ඩී.දිල්සානි ප්‍රශාදිකා මැතිනිය** ගරු සභාපතිතුමනි,මල්වත්ත වසමේ දේශපාලන පක්ෂ වලින් තොරව පවුල් 330 කට හාල් දීලා තියෙනවා.තවත් 150කට තෝරලා දුන්නා. තවමත් පවුල් 50 පමණයි තියෙන්නේ.වසමේ නිළධාරින් ගොඩක් මහන්සි වෙලා මේ වැඩේට උදව් වුණා.එයාලට අපි ස්තුතිවන්ත වෙනවා.

***ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි,2021 කොරෝනා කාලේ හදපු ලැයිස්තුවට තමයි බඩු දෙන්නේ,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දැනුවත් කරන්න.අත්‍යවශ්‍ය කණ්ඩායම් වලට ප්‍රමුඛතාවය දිය යුතුයි

***ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ශාන්ත කුමාර හෙට්ටිකන්ද මැතිතුමා** ගරු සභාපතිතුමනි, මල්වත්ත වසමේ සාධාරණව ඒ කටයුත්ත ඉටු කරලා තියෙනවා.අනෙත් අයටත් සාධාරණයක් ඉටු වෙයි කියලා මම හිතනවා.

**01.නොපැමිණි ගරු මන්ත්‍රීතුමන්ලාගේ නිවාඩු අනුමත කිරිම**
**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.සත්‍යානන්දන් මැතිතුමා** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.කමල්රාජ් මැතිතුමා සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.පී.ජී.ඩබ්.කීර්තිසේන අල්විස් මැතිතුමා අසනීප වීම නිසා අද දින සභාවට පැමිණිමට නොහැකි බව දන්වා සිටිනවා.එබැවින් අද දින නිවාඩු ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.කමල්රාජ් මැතිතුමා සහ ටී.පී.ජී.ඩබ්.කීර්තිසේන අල්විස් මැතිතුමා අසනීප වීම නිසා අද දින සභාවට පැමිණිමට නොහැකි බැවින් අද දින නිවාඩු අනුමත කරන බව ගරු මහ සභාවට මා දන්වා සිටිනවා.

**02.ගරු මන්ත්‍රීතුමන්ලාගේ අදහස් දැක්වීම**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ආර් ලාල් නිශාන්ත මැතිතුමා** ගරු සභාපතිතුමනි, ගරාගොඩ වීථි පහන් අක්‍රීය වෙලා තියෙන්නේ ඒ ටික සකස් කරලා දෙන්න.

***සභාපතිතුමාගේ ස්තුති කථාව**
දැන් රටේ පවතින තත්වයත් සමග අනාගතය ගැන කියන්න බෑ.ඒ කෙසේ වෙතත් සභාවට පැමිණිලා සභාවේ කටයුතු සාර්ථක කර ගැනිමට හැකි වීම පිළිබඳව ගරු මන්ත්‍රී මණ්ඩලයටත්,ලේකම්තුමා ඇතුළු කාර්යය මණ්ඩලයටත් ,මාධ්‍ය ආවරණය සඳහා පැමිණි මාධ්‍යවේ දි මහත්වරුන්ටත් ගෞරවනීය ස්තුතිය පුද කරමින් ප.ව 01.00 ට මහ සභා රැස්වීම අවසන් කරන ලදි.